009

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනපති උපාධි වැඩසටහන 2022/2023

අවසාන පරීක්ෂණය - 2022

**SNPA903 -** විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ විෂයමාලා උපදේශනය හා තක්සේරුව

කාලය - පැය තුන (03) යි.

---

දිනය : 2024.02.25 වේලාව : පෙ.ව. 09.30 - ප.ව. 12.30 දක්වා

---

ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.

01. (i.) ඉගෙනීම සඳහා විශ්වීය පිරිසැලසුම (UDL) සහ වෙනස් වූ උපදේශනය (DI) අතර වෙනස හා අර්ථකථනය කරන්න. (ලකුණු 20)

(ii.) විවිධ අවශ්‍යතා සහිත සිසුන් සිටින පන්ති කාමරයකදී ඉගෙනීම සඳහා වූ විශ්වීය පිරිසැලසුම් (UDL) හා වෙනස් වූ උපදේශනය (DI) පිළිබඳ මූලධර්ම යොදා ගැනීම පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 40)

(iii.) ඉගෙනීම සඳහා වූ විශ්වීය පිරිසැලසුම (UDL) ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා ප්‍රධාන ධාරාවේ විෂයමාලා වෙත ප්‍රවේශය සහතික කිරීමේ හැකියාව පැහැදිලි කරන්න. ශ්‍රී ලාංකීය පන්තිකාමර සඳහා ඉගෙනීම සඳහා වූ විශ්වීය පිරිසැලසුම් (UDL) අන්තර්ග්‍රහණය කිරීම සඳහා නිවැරදි උදාහරණ සපයන්න. (ලකුණු 20)

02. (i.) විශේෂ අවශ්‍යතා උපදේශනයේදී සාක්ෂි මත පදනම් වූ භාවිතය (EBPs) සංකල්පය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 20)

(ii.) විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය තුළ ඔබ තෝරාගත් විශේෂ ක්ෂේත්‍රයක් සඳහා සුවිශේෂී සාක්ෂි මත පදනම් වූ භාවිතයන් ( EBPs) දෙකක් විස්තර කරන්න. ඒවා ක්‍රියාත්මක කිරීම පිළිබඳ සත්‍ය ජීවිතයෙන් ගන්නා ලද උදාහරණ දෙකක් සපයන්න. (ලකුණු 40)

(iii.) ශ්‍රී ලංකාවේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් සඳහා යෝග්‍ය වෙනස් ඉගෙනුම් ඉගැන්වීම් නවීකරණයන් සාකච්ඡා කරන්න. මෙම නවීකරණයන් පෞද්ගලික අවශ්‍යතා ඉටු කිරීමට හා ඉගෙනුම් ඵල දියුණු කිරීමට යොදාගත හැක්කේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 40)

03. (i.) පෞද්ගලීකරණය කරන ලද අධ්‍යාපන සැලසුම් (IEP) යනු කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 20)

(ii.) ශ්‍රී ලාංකීය සංදර්භය තුළ විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා පෞද්ගලිකරණය කරන ලද අධ්‍යාපන සැලසුමක තිබිය යුතු අංග හා වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 40)

(iii.) ශ්‍රී ලංකාවේ විශේෂ ආබාධ සහිත සිසුන් තක්සේරුකරණය සඳහා භාවිත කළ හැකි විවිධ ශිල්පීය ක්‍රම හා ක්‍රම විශ්ලේෂණය කරන්න. වෙනස් ඉගෙනුම් පැතිකඩ සඳහා විධිමත් හා අවිධිමත් ක්‍රම දෙකෙහිම යෝග්‍යතාවන් සැලකිල්ලට ගන්න. (ලකුණු 40)

04. (i.) විෂයමාලා ප්‍රවේශයන්හි ප්‍රධාන ප්‍රතිවිරුද්ධ කාණ්ඩ පැහැදිලි කරන්න.
(ලකුණු 20)

(ii.) විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ට උදව් කළ හැකි එකිනෙකට වෙනස් විෂයමාලා ප්‍රවේශ දෙකක් සන්සන්දනය කරන්න. (ලකුණු 40)

(iii.) ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය විවිධතා, ගුරු සම්පත් හා සමාජීය ආකල්ප වැනි සාධක සැලකිල්ලට ගනිමින්, ඔබ විසින් සඳහන් කරන ලද ප්‍රවේශවල වාසි හා අභියෝග විශ්ලේෂණය කරන්න. (ලකුණු 40)

-සියළුම හිමිකම් ඇවිරිණි.-